# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,890—1970 ජනවාරි 23 වැනි සිකුරාදා—1970.1.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 53 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 47 | මිළ පාලන දැන්වීම ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 47 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 48 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 52 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 58 |
| | | " සුරාබද්ධ ආඥපනත " පිළිබඳ දැන්වීම ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 24**

අ. ආ. කා. අංක: එන්. 126/69.

අග්‍රාණ්ඩුකාරතුමන් විසින් (393 වැනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 19 (1) වැනි වගන්තිය යටතේ, ලංකා පරිපාලන සේවයේ; ඩෙරික් අලුවිහාරේ මහතා 1969 දෙසැම්බර් 9 වැනි දින සිට, එකී පනත යටතේ, 1969 දෙසැම්බර් 7 වැනි දින පත් කරන ලද උසස් අධ්‍යාපන කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 ජනවාරි 9 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී ය.

1-770

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 25**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝගකර ඇත :—

ඒ. 7/69.

ඉඩම් කච්චේරි පරිපාලන, ඩී. ජී. ජයසූරිය මහතා 1969 ජූනි 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අම්පාර පාලන දිස්ත්‍රික්කයේ වැවගම්පත්තුව කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිළධාරි ලෙස වැඩ බැලීමට.

ඒඒ. 35/69.

සහකාර සර්වේ ජනරාල් එස්. පොන්නම්පලම් මහතා, 1968 ජූලි 19 වැනි දින සිට නියෝජ්‍ය සර්වේ ජනරාල් වශයෙන්.

ඒ. 20/67.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු, වී. රත්නසුන්දරම් මහතා 1969 ඔක්තෝබර් 1 දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

ඒ. 20/67.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන ජ්‍යෙෂ්ඨ තක්සේරු කරු, එස්. ධර්මරාජා මහත්මිය 1969 ඔක්තෝබර් 1 දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස.

ඒ. 20/67.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන ජ්‍යෙෂ්ඨ තක්සේරු කරු, එස්. රාජසිංහම් මහත්මිය 1969 ඔක්තෝබර් 1 දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස.

ඒ. 20/67.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු, එම්. එස්. එම්. ටී. සමරතුංග මහතා 1969 සැප්තැම්බර් 1 දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු තනතුරක රාජකාරියෙහි යෙදීමට 1969 ඔක්තෝබර් 1 දින සිට වැඩබලන ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස.

ඒ. 20/67.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු, සී. ජී. පෙරේරා මහතා 1969 සැප්තැම්බර් මස 2 වැනි දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු තනතුරක රාජකාරියෙහි යෙදීමට සහ 1969 ඔක්තෝබර් 1 දින සිට වැඩ බලන ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස.

ඒ. 20/67.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු, කේ. සිරිවර්ධන මහත්මිය 1969 සැප්තැම්බර් 15 දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේරු කරු තනතුරක රාජකාරියෙහි යෙදීමට සහ 1969 ඔක්තෝබර් 1 දින සිට වැඩ බලන ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස.

ඒ. 20/67.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සී. ද ඒ. ගුණවර්ධන මහතා 1969 සැප්තැම්බර් 15 දින සිට ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු තනතුරක රාජකාරියෙහි යෙදීමට සහ 1969 ඔක්තෝබර් 1 දින සිට වැඩ බලන ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ලෙස.

ඒ. 8/69.

ඒකාබද්ධ රේගු සේවයේ විශේෂ ශ්‍රේණියේ පී. එන්. ගුණසිංහ මහතා 1969 ඔක්තෝබර් 1 වැනි දින සිට සහකාර රේගු අයකැමිවරයකු ලෙස වැඩ බැලීමට.

ඒ. 8/69.

ඒකාබද්ධ රේගු සේවයේ විශේෂ ශ්‍රේණියේ ඒ. එම්. පී. ජයවර්ධන මහතා 1969 ඔක්තෝබර් 1 වැනි දින සිට සහකාර රේගු අයකැමිවරයකු ලෙස වැඩ බැලීමට.

ඒ. 8/69.

ඒකාබද්ධ රේගු සේවයේ විශේෂ ශ්‍රේණියේ ජී. ඩබ්. ද වොස් මහතා 1969 ඔක්තෝබර් 1 වැනි දින සිට සහකාර රේගු අයකැමි වරයකු ලෙස වැඩ බැලීමට.

ඒ. 8/69.

ඒකාබද්ධ රේගු සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්. එම්. ජී. ප්‍රනාන්දු මහතා 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට සහකාර රේගු අයකැමිවරයකු ලෙස වැඩ බැලීමට.

ඒඒ. 30/68.

ටී. ඩබ්ලිව්. මෙන්ඩිස් මහතා 1969 නොවැම්බර් 1 වැනි දින සිට විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකරු වශයෙන්.

ඒ. 76/67.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, ඩබ්ලිව්. එල්. පී. ද මැල් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළදී සහකාර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, (ගගන යාත්‍රාංගන) කපිතාන් සී. එච්. එස්. අමරසේකර ස්වකීය රාජකාරිවලට අතිරේකව 1969 නොවැම්බර් 11 වැනි දින සිට 1969 නොවැම්බර් 23 වැනි දින දක්වා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ හා ලංකා ගුවන් යානා රෙජිස්ට්‍රාර් තනතුරේ රාජකාරියන්හි යෙදීමට.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජනවාරි මස 12 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 500,
කොළඹ 1.

1-860

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 26

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය

අංකය : සීජේපී/ඩී. 12/48.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් සහ එදින සිට නැවත නියමයක් කරන තුරු, මාතර දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සී. ජේ. පී/ඒ. 5/49.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් සහ එදින සිට නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 47/66.

ඩී. විමලරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේකව වශයෙන්, 1969 දෙසැම්බර් මස 31 වැනි දින, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් ධුරය සථිර වශයෙන් උසුලන අය නිවාඩු පිට සිටින අතර එහි වැඩ බැලීමට.

අංකය : ජේඑස්සී/පීපී. 7/69.

එම්. ඊ. ධර්මවර්ධන මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කෑගල්ලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, කෑගල්ලේ ළමා මහෙස්ත්‍රාත් තැන, කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑස්සී/පීපී. 7/69.

ජී. ජී. ඩී. ද. සිල්වා මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, පානදුරේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, සහ පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/ඩී. 24/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, යාපනේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, යාපනේ නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, කයිට්ස්හි මහෙස්ත්‍රාත් තැන සහ රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑස්සී/පීපී. 7/69.

එම්. ජමීල් මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තෙක්, ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑස්සී/පීපී. 7/69.

ජී. සී. ඩබ්ලිව්. ද. සිල්වා මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, තංගල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑස්සී/පීපී. 7/69.

එම්. බී. ජී. දිසානායක මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මන්නාරමේ සහ වවුනියාවේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන සහ මහෙස්ත්‍රාත් තැන සහ මන්නාරමේ සහ වවුනියාවේ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : සීජේපී/එන්. 6/67.

ආර්. නවරත්නම් මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ලංකා අධිකරණ සේවයේ අතිරික්ත නිලධාරියෙකු වශයෙන්.

අංකය : සීජේපී/එස්. 35/68.

එච්. ඩබ්ලිව්. සේනානායක මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, හම්බන්තොට මහෙස්ත්‍රාත් තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන, සහ ළමා මහෙස්ත්‍රාත් තැන, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/ඩබ්ලිව්. 11/64.

එස්. ජේ. ඩී. ද. එස්. විජේරත්න මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට, බදුල්ලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, බදුල්ලේ නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : සීජේපී/එස්. 26/61.

ජේ. සේනාතිරාජ මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ගාල්ලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ගාල්ලේ නාගරික මහෙස්ත්‍රාත් තැන, සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/එස්. 28/62.

කේ. වී. ස්වර්ණාධිපති මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, කුරුණෑගල මහෙස්ත්‍රාත් තැන අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/ජේ. 12/62.

එස්. ජෝනනාදන් මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, බලපිටියේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/ආර්. 12/67.

පී. බී. රඹුක්වැල්ල මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මීගමුවේ මහෙස්ත්‍රාත් තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66.

බී. ආර්. සිල්වා මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : සීජේපී/එම්. 13/69.

ඒ. එච්. ඊ. මොලමුරේ මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, පොළොන්නරුවේ ක්‍රියා කරන අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑම්. ජී. 40/66.

එම්. එස්. එස්. කොරයා මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, සහ මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්./ජී. 40/66.

වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, කුලියාපිටිය පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ, කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, කුරුණෑගල අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ (කුලියාපිටිය පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුළ) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 40/66.

එන්. බී. ඩී. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. නවරත්නම් මහතා 1970 ජනවාරි මස 1 වැනි දින සිට 7 වැනි දින දක්වා, අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජේ. 40/66.

අයි. ජී. එන්. ද. ජේ. සෙනවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. නවරත්නම් මහතා 1970 ජනවාරි මස 8 වැනි දින සිට 28 වැනි දින දක්වා, අතිරික්ත නිලධාරියෙකු වශයෙන් සහ කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, සහ කොළඹ නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑම්/ජී. 4/66.

එම්. පී. විජේසිංහ මහතා 1969 දෙසැම්බර් මස 29 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, මන්නාරම සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑඑ/26/48.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කළුතර දිස්ත්‍රික් උසාවියේ අංක එල්ඒ. 161 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස 1970 ජනවාරි මස 26 දින සිට කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඒඒ. 37/64.

සී. අමරසිංහ මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් කුලියාපිටිය ම. උ. අංක 40,213, 49,207, 49,531 සහ 43,295 දරණ නඩුවල තීන්දු දීම පිණිස, 1970 ජනවාරි මස 4 දින සිට කුලියාපිටිය පළාත් ආණ්ඩු සභා සීමාව තුළ පිහිටි කනදුල්ලේ ක්‍රියා කරන කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජේ. 11/61.

එම්. ජමීල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. කතගරත්නම් මහතා 1969 දෙසැම්බර් මස 29 දින සිට 31 වැනි දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, කයිට්ස්හි අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 11/65.

ජේ. ජී. ආසිර්වාදම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩී. සෙන්ට්. ඒ. අමරසිංහ මහතා 1969 දෙසැම්බර් මස 29 වැනි දින සිට 1970 ජනවාරි මස 2 වැනි දින දක්වා, අවිස්සාවේල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1969 දෙසැම්බර් මස 21, 22 සහ 28 දින සිට 30 වැනි දින දක්වා සහ 1970 ජනවාරි මස 5 වැනි දින සිට 7 වැනි දින දක්වා, ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 26/61.

ජේ. සේනාතිරාජ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. ජේ. පීරිස් මහතා 1969 දෙසැම්බර් මස 22 දින සිට 29 වැනි දින දක්වා, බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 12/57.

පි. බී. රඹුක්වැල්ල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ටී. එස්. පී. ද එස්. ගුණසේකර මහතා 1969 දෙසැම්බර් මස 31 දින, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 9/67.

එල්. එස්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එෆ්. ආර්. වීරසේකර මහතා 1969 දෙසැම්බර් මස 22 දින සහ 24 වැනි දින සිට 1970 ජනවාරි මස 2 වැනි දින දක්වා, රත්නපුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/යූ. 1/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එල්. එන්. වික්‍රමසිංහ මහතා 1969 දෙසැම්බර් මස 24 වැනි දින ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 12/66.

ඒන්. බී. ඩී. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩබ්ලිව්. ඩී. පෙරේරා මහතා 1969 දෙසැම්බර් මස 21 වැනි දින, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. සිමම්පිල්ලේ මහතා 1970 ජනවාරි මස 4 වැනි දින සිට 7 වැනි දින දක්වා, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1969 දෙසැම්බර් මස 23 වැනි දින සිට 25 වැනි දින දක්වා, වව්නියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/කේ. 8/64.

එස්. කඩවතආරච්චි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. සූරියආරච්චි මහතා 1969 දෙසැම්බර් මස 19, 20, 21. 22 සහ 24 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරිය සහ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/16/67.

එස්. ආර්. අබේවික්‍රම මහතා 1969 දෙසැම්බර් මස 27 වැනි දින සිට කොග්ගල ගම්බද උසාවියේ අංක 12805 දරණ අපරාධ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස ගාලු දිස්ත්‍රික්කයේ ගඟබොඩ හා ගිනිදුම් පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් සහ වැල්ලබඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/ඊ. 10/63.

පී. ජේ. එස්. ඒ. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, අර්වින් ප්‍රනාන්දු මහතා 1969 දෙසැම්බර් මස 26 වැනි දින, හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරළයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/එස්. 13/61.

එම්. ජේ. ටී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ජී. පී. කරුණාරත්න මහතා 1969 දෙසැම්බර් මස 20 වැනි දින සහ 1970 ජනවාරි මස 8 වැනි දින ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරළේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/ඩබ්ලිව්. 9/53.

පී. සී. පී. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. ඊ. පීත්තු මහතා 1969 දෙසැම්බර් මස 27 වැනි දින, පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු හා කඩවත් කල්පිටිය, රාජවන්නි සහ කුමාරවන්නි පළාත, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති සහ පිටිගල් කෝරළේ උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/සී. 2/62.

සී. ඒ. එස්. ඊ. ක්‍රිස්පින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. එන්. ප්‍රේමරත්න මහතා 1969 දෙසැම්බර් මස 22 වැනි දින සහ 24 වැනි දිනයන්හි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති සහ ගල්ගමුව, නිකවැරටිය, කුලියාපිටිය, පන්නල, බිංගිරිය, ගිරියාල හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : පීඑල්/ආර්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1969 දෙසැම්බර් මස 24 වැනි දින, වව්නියා සහ මන්නාරම් දිස්ත්‍රික්කයන්හි වව්නියා දකුණ ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 16/62.

කේ ෂන්මුගනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. කනපතිපිල්ලේ මහතා 1969 දෙසැම්බර් මස 7 වැනි දින, පේදුරුතුඩුව දිස්ත්‍රික්කයේ තෙන්මරච්චි, පච්චලයි පලෙයි, කරච්චි සහ පූනාකරි තුන්නුකායි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 4/59.

ඩී. බී. ඇල්ලේපොල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. සූරියආරච්චි මහතා 1969 දෙසැම්බර් මස 19 වැනි දින සිට 22 වැනි දින දක්වා සහ 24 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩවිලි හත්පත්තුවේ සහ ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන්, බැඩ බැලීමට.

අංකය : පීඑල්/සී. 2/50.

ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ඩබ්ලිව්. ඩී. එන්. වෙත්තසිංහ මහතා 1969 දෙසැම්බර් මස 20 වැනි දින සහ 28 වැනි දිනයන්හි, රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද සහ නවදුන් කෝරළේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 6/67.

එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. රාසයියා මහතා 1969 දෙසැම්බර් මස 28, 29 සහ 31 වැනි දිනයන්හි, යාපනය දිස්ත්‍රික්කයේ දිවයින්වල සහ බස්නාහිර වලිකාමම්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජේ. 6/63.

කේ. ජී. ජයසේන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. බී. දෙහිගම මහතා 1969 දෙසැම්බර් මස 28 වැනි දින සහ 29 වැනි දිනයන්හි මහනුවර දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ සහ නැගෙනහිර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 4/48.

කේ. නාගලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එච්. කාරියප්පර් මහතා 1970 ජනවාරි මස 2, 3, 4, 5 සහ 6 වැනි දිනයන්හි, කල්මුනේ දිස්ත්‍රික්කයේ කරවතු සහ නින්තාවූර් පත්තු, සමන්තුරෙයි පත්තු සහ වැව්ගම් පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 3/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. සිමම්පිල්ලේ මහතා 1970 ජනවාරි මස 5 සහ 6 වැනි දිනයන්හි මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරමේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 5/53.

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ඊ. ඉලංගන්තිලක මහතා 1969 දෙසැම්බර් මස 29 සහ 31 වැනි දිනයන්හි මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ හාරිස් පත්තු සහ පහත හේවාහැට උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.එල්/ඩී. 9/61.

එම්. ඒ. සී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. ඒ. ප්‍රේමතිරත්න මහතා 1970 ජනවාරි මස 2 වැනි දින, මීගමුව දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ උතුර ඒ සහ බී, අළුත් කුරු කෝරලේ දකුණ සහ සියනෑ කෝරලේ බටහිර (අධිකාරී පත්තුව) ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 10/61.

ඩබ්ලිව්. බී. දසනායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. ඩබ්ලිව්. රාජකරුණා මහතා 1970 ජනවාරි මස 4, 5 සහ 6 වැනි දිනයන් හී, ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑකෝරලේ, බටහිර සියනෑ කෝරලේ, (මැද පත්තුව) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ දකුණු අළුත්කුරු කෝරලේ ගම්බද උසාවි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 10/61.

ඩබ්ලිව්. බී. දසනායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. ජේ. අතපත්තු මහතා 1970 ජනවාරි මස 2 වැනි සහ 3 වැනි දිනයන් හී, ගම්පහ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑ කෝරලේ, බටහිර සියනෑ කෝරලේ, (මැද පත්තුව) සහ හාපිටිගම් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ දකුණු අළුත්කුරු කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 ජනවාරි මස 6 දා,
කොළඹ 12, තැ. පෙ. අංකය 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඹාලයේ දී ය.

1-761/1

---

1970 අංක 27

අංකය : ජේඑම්/ජී. 75/66.

**අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද අවලංගු කිරීම්**

ඒ. බී. අළුවිහාරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ඊ. ඉලංගන්තිලක මහතා 1969 දෙසැම්බර් මස 18 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ හාරිස්පත්තු සහ පහත හේවාහැට, උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට දී ඇති පත්වීම මෙයින් අවලංගු වේ.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 ජනවාරි මස 6 දා,
කොළඹ 12,
තැ. පෙ. අංකය 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඹාලයේ දී ය.

1-761/2

---

# වෙනත් පත් කිරීම් ආදිය

1970 අංක 28

ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇත :—

75/10/26 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ ආර් ටී. රත්නතුංග මහතා ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්වකීය රාජකාරිවලට අතිරේකව 1969 දෙසැම්බර් මස 14 වැනි දින සිට නැවත නියම යක් කරනතුරු ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

75/2/4 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ආර්. එල්. ගුණසේකර මහතා 1969 දෙසැම්බර් මස 12 වැනි දින සිට නැවත නියම යක් කරනතුරු කම්කරු කොමසාරිස් වශයෙන්.

75/10/90 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ටී. ආර්. ආර්. විජේවික්‍රම මහතා 1969 දෙසැම්බර් මස 12 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

75/4/18/7 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එම්. පී. ඩබ්ලිව්. අමරසේකර මහතා 1969 ජනවාරි මස 20 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (ලං. ප. සේ. III වැනි පන්තිය) සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

75/1/15 (එම්සීඑ) IV.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එන්. පී. ජෙගනාදන් මහතා 1969 මැයි මස 4 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පාලන නිලධාරි වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ආර්. ජී. ගෝමස් මහතා 1969 සැප්තැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඩබ්ලිව්. එම්. සී. ඩබ්ලිව්. එම්. අපොන්සෝ මහතා 1969 මැයි මස 3 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එන්. ඩබ්ලිව්. එච්. සී. ගුණරත්න මහතා 1969 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ආනයන හා අපනයන නියෝජ්‍ය පාලකවර යෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මෙන්ඩිස් මහතා 1969 මැයි මස 1 වැනි දින සිට නැවත නියම යක් කරනතුරු සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්වර යෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඒ. මාදෙන මහතා 1969 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මහනුවර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ටී. සැමුවෙල් තම්බයියා මහතා 1969 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඩී. ආර්. සී. හන්වැල්ල මහතා 1969 මැයි මස 1 වැනි දින සිට නැවත නියම යක් කරනතුරු මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් සහ මෝටර් රථ වාහන රෙජිස්ට්‍රාර් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ බී. කේ. අබේරත්න මහතා 1969 මැයි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වශයෙන්.

75/3/23 (එම්සීඑ)

ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ඩබ්ලිව්. එම්. සී. ඩබ්ලිව්. එම්. අපොන්සෝ මහතා 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මුළු දිවයින සඳහාම නියෝජ්‍ය ආහාර කෙමසාරිස්වරයෙකු, නියෝජ්‍ය ආහාර සැපයීම් අධ්‍යක්ෂවරයෙකු, නියෝජ්‍ය ආහාර පාලකවරයෙකු සහ නියෝජ්‍ය මිල (ආහාර) පාලකවරයෙකු වශයෙන්.

75/3/6 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ ටී. ඩී. එල්. පීරිස් මහතා 1969 සැප්තැම්බර් මස 11 වැනි දින සිට 1969 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

75/4/18/13 (එම්සීඑ).

ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියේ ඒ. එල්. බී. කේ. පෙරේරා මහතා 1969 නොවැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ සහකාර ලෙකම්වරයෙකු වශයෙන්.

75/1/23 (එම්සීබී) VI.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එෆ්. ජයගොඩ මහතා 1969 අප්‍රේල් මස 3 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරියෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එෆ්. ජයගොඩ මහතා 1969 අප්‍රේල් මස 20 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාණ්ඩලික සහකාර සහ සෞඛ්‍ය සභාවේ ලේකම් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ කේ. කේ. සී. ඩී. ආර්. ද සිල්වා මහතා 1969 අප්‍රේල් මස 3 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක ලේකම්වරයෙකු වශයෙන්.

75/10/389 (එම්සීබී.)

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ සී. එච්. එම්. ට්. චන්ද්‍රසේකර මහතා 1969 ජූනි මස 25 වැනි දින සිට 1969 ජූලි මස 18 වැනි දින දක්වා කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

75/1/23 (එම්සීබී) II.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ආර්. කේ. එච්. එම්. ප්‍රනාන්දු මහතා 1969 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

75/1/13/1 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ඩබ්ලිව්. බී. සෝමරත්න මහතා 1969 මැයි මස 7 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

75/10/554 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එස්. තම්බිරාජා මහතා 1969 සැප්තැම්බර් මස 16 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, ආයුර්වේද දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

75/10/883 (එම්සීබී)

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එම්. දිසානායක මහතා 1969 සැප්තැම්බර් මස 30 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

75/10/1146 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ඩබ්ලිව්. බී. සෝමරත්න මහතා 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මහා භාණ්ඩාගාරයේ ජ්‍යෙෂ්ඨ රැකීරක්ෂා සම්බන්ධතා නිලධාරී වශයෙන්.

75/10/849 (එම්සීබී.)

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එස්. ආර්. ප්‍රනාන්දු මහතා 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, ජාතික නිවාස සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ එල්. එල්. ඩී. පෙරේරා මහතා 1969 ඔක්තෝබර් මස 1 වනි දින සිට නැවත නියමයක් කරනතුරු, සහකාර රබර් පාලක වරයෙකු වශයෙන්.

75/10/365 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ වී. සී. කරුණානන්ද මහතා 1969 ඔක්තෝබර් මස 7 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනතේ (463 වන පරිච්ඡේදයේ) 3 (1) යටතේ නිරවුල් කිරීමේ සහකාර නිලධාරියෙකු වශයෙන්.

75/5/25 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ජේ. ජී. කීර්තිරත්න මහතා 1969 නොවැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, පළාත් පාලන සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

75/5/8 (එම්සීබී)

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ට්. රුද්‍රමූර්ති මහතා 1969 නොවැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මඩකලපු පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර වශයෙන්.

75/1/23/6 (එම්සීබී) II.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ ආර්. කේ. එච්. එම්. ප්‍රනාන්දු මහතා 1969 නොවැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ දෙහිගම් පල් කෝරලේ හා පාත බුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ සී. බී. ලියනගෙදර මහතා 1969 නොවැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

75/1/14/2 (එම්සීබී).

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ අයි. වික්‍රමසිංහ මහතා 1969 දෙසැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් පාලන අංශයට අනුයුක්තව සිටීමට.

එම්. රාජේන්ද්‍ර,
භාණ්ඩාගාරයේ ලේකම්.

1970 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ,
මුදල් අමාත්‍යාංශයේදීය.

1-760

---

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. සී. ඩී. 27/64.

### 1969 අංක 29 දරන පැනගිය තැනැත්තන් පිළිබඳ පනත

1 වැනි වගන්තිය යටතේ වූ ආඥාව

1969 අංක 29 දරන පැනගිය තැනැත්තන් පිළිබඳ පනතේ 1 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ඩඩ්ලි සේනානායක වන මම ඉහත කී පනත ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් 1970 ජනවාරි මස 11 වැනි දිනය මේ ආඥාවෙන් නියම කරමි.

ඩඩ්ලි සේනානායක,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
පිළිබඳ ඇමති.

1970 ජනවාරි මස 11 වන දින,
කොළඹ.

1-852/1

---

### නිවේදනය

1946 සහ 1947 ලංකා (ආණ්ඩු ක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 46(4) අංකිත ඡේදයේ විධිවිධාන යටතේ, අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක වන මම, මේ නිවේදනයේ සඳහන් දින සිට 1969 අංක 29 දරන පැන ගිය තැනැත්තන් පිළිබඳ පනත හා සම්බන්ධ විෂය හා කාර්යය අග්‍රාමාත්‍යවරයා වශයෙන් හා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යවරයා වශයෙන් මගේ භාරයෙහි තබා ගන්නා බවත්, ඒ අනුව, ඉහත සඳහන් ඡේදය යටතේ කරනු ලැබ අංක 14,721/3 හා 1966 නොවැම්බර් 12 දින දරණ ගැසට් අති විශේෂයේ පළකර වරින්වර සංශෝධනය කරනු ලැබූ නිවේදනයේ "අග්‍රාමාත්‍ය හා ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති" යන ශීර්ෂය යටතේ "විෂයයන් හා කාර්යයන්" ව අදාල තීරයේ "1969 අංක 29 දරණ පැන ගිය තැනැත්තන් පිළිබඳ පනතේ පරිපාලනය" යන වචන ඇතුළත් කිරීමෙන් එකී නිවේදනය තවදුරටත් සංශෝධනය කරන බවත් මෙයින් නිවේදනය කරමි.

ඩඩ්ලි සේනානායක,
අග්‍රාමාත්‍ය.

අග්‍රාමාත්‍ය කාර්යාලය, කොළඹ,
1970 ජනවාරි 11 දින.

1-852/2

---

ඇල්. ඩී. බී. 7/63

### 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

16අ වැනි වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16අ වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති උක්කු බණ්ඩා වන්නිනායක වන මම මෙහි උපලේඛනයේ දැක්වෙන එක් එක් ආයතනය එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 ජනවාරි මස 12 වෙනි දින,
කොළඹ දීය.

#### උපලේඛනය

(1) වීරගොඩ ශ්‍රී විජයනන්දනාරාම විහාර කාර්ය සාධක සමිතිය.
(2) විශාඛා විද්‍යාලයීය ගොඩනැගිලි අරමුදල

1-762

එල්. ඩී.—බී 23/63

අංකය : ඊඩී 04/001 (11).

## 1963 අංක 11 දරන මුදල් පනත

### 58 (4) (උ) වගන්තිය යටතේ වූ ආඥාව

1963 අංක 11 දරන මුදල් පනතේ 58 වැනි වගන්තියේ (4)(උ) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක, වන මම, මේ ආඥාව මගින්—

(අ) (1), (2) හා (3) වන උපවගන්තිවල කාර්යයන් සඳහා මෙහිවූ උපලේඛනයෙහි දැක්වෙන දේපළවල වර්ගය හෝ විස්තරය නිශ්චිතව සඳහන් කරමි ; තවද

(ආ) 1963 අංක 11 දරන මුදල් පනතේ 58 වන වගන්තියේ (4) (උ) වන උපවගන්තිය යටතේ පනවන ලදුව, 1969 ඔක්තෝබර් මස 17 වන දින අංක 14,876 දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ ආඥාව අවලංගු කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1970 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. ඇනට හැම්බර්ග් මාර්ගරින් යූනියන් ජී. ඇම්. බී. එච්. විසින් දරනු ලබන, ඕලන්දයෙහි, රොටර් ඩෑම් හි) "මාර්ගා" (මාර්ක්ස් වපීජ් තොක් බෙහීර් වැග් අන්දිලෙන් ඉන් ඉන්ඩස්ට්‍රිල් ඔන්ඩර් නෙමින්ජන්) එන්. වී. වෙත පවරනු ලැබීමට නියමිත සීමාසහිත සීට් සමාගමෙහි රු. 10 බැගින් වූ කොටස් දෙකක්.

2. ඇනට හැම්බර්ග් ෂී සීට් ඉම්පෝට් සමාගම විසින් දරනු ලබන, ඕලන්දයෙහි රොටර්ඩෑම් හි "මාව්බෙල්" (මාක්ස්වපීජ් වූර් ඉන්ටනැෂනල් බෙලෙජ්ක්ජන්) එන්. වී. වෙත පවරනු ලැබීමට නියමිත සීමාසහිත සීට් සමාගමෙහි රු. 10 බැගින් වූ කොටස් 5,22,455 ක්.

1-779

---

## තැපැල් කාර්යාල ආඥාපනත

තැපැල් නැව් නොවන නෞකාවල ප්‍රධානීන්හට, ඒ ප්‍රධානීන් විසින් තැපැල් කාර්යාලය වෙනුවෙන් භාරදීම සඳහා භාරගනු ලැබූ තැපැල් භාණ්ඩ සම්බන්ධයෙන් 1968 නොවැම්බර් මස 22 වෙනි දින හා අංක 14,829 දරණ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයෙන් විස්තර කරනු ලැබූ ප්‍රමාණය අනුව වූ පාරිතෝෂික වෙනුවට මීට යා කොට ඇති උපලේඛනයෙහි දක්වෙන ප්‍රමාණ අනුව පාරිතෝෂික ලැබිය යුතු යයි (190 වෙනි අධිකාරය) වන තැපැල් කාර්යාල ආඥාපනතෙහි 44 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමති, වෝල්ටර්ජියෝෆ්‍රි මොන්ටේගු ජයවික්‍රම වන මම, මුදල් ඇමතිවරයාගේ එකහත්වය ඇතිව, මේ නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. මොන්ටේගු ජයවික්‍රම,
රජයේවැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1969.12.29 දින,
කොළඹ දීය.

### උප ලේඛනය

| ගමනාන්ත රට | ලියුම් මලු 16ක ඒකකයක් සඳහා (ස.අ. 40කට සමානයි) | පාර්සල් තැපැල් මලු 7ක ඒකකයක් සඳහා (ස.අ. 40 කටසමානයි) | හිස්මලු 16ක ඒකකයන් සඳහා (ස. අ. 40 කට සමානයි) |
|---|---|---|---|
| | ප. සි.පැ. | ප. සි.පැ. | ප. සි.පැ. |
| (අ) එක්සත් රාජධානිය | ... 20 2 0 | ... 13 8 0 | ... 13 8 0 |
| මාර්සේල්ස් ... | ... 20 2 0 | ... 13 8 0 | ... 13 8 0 |
| ජෙනෝවා ... | ... 20 2 0 | ... 13 8 0 | ... 13 8 0 |
| පෝට් සේඩ් සහ සූවස් | ... 20 2 0 | ... 13 8 0 | ... 13 8 0 |
| ඉතාලිය ... | ... 20 2 0 | ... 13 8 0 | ... 13 8 0 |
| පෝට් සුඩෑන් ... | ... 17 6 0 | ... 11 10 0 | ... 11 10 0 |
| ඒඩන් ... | ... 17 6 0 | ... 11 10 0 | ... 11 10 0 |
| ටැන්ජියර් ... | ... 21 14 0 | ... 14 10 0 | ... 14 10 0 |
| ජිබ්‍රෝල්ටර් ... | ... 21 14 0 | ... 14 10 0 | ... 14 10 0 |
| මෝල්ටා ... | ... 25 18 0 | ... 17 6 0 | ... 17 6 0 |
| පිනැංගුව ... | ... 6 2 6 | ... 4 1 6 | ... 4 1 6 |
| සිංගප්පූරුව ... | ... 7 6 0 | ... 4 17 6 | ... 4 17 6 |
| හොංකොං ... | ... 8 12 0 | ... 5 14 6 | ... 5 14 6 |
| ෂැංහයි ... | ... 11 19 0 | ... 7 19 6 | ... 7 19 6 |
| සයිගොන් ... | ... 9 14 0 | ... 6 9 6 | ... 6 9 6 |
| ජපානය ... | ... 12 14 0 | ... 8 9 6 | ... 8 9 6 |
| ඕස්ට්‍රේලියාව ... | ... 12 10 3 | ... 8 7 3 | 8 7 3 |
| පිලිපයින් දූපත් ... | ... 12 0 6 | ... 8 0 6 | ... 8 0 6 |
| | ඩො. ශ. | ඩො. ශ. | ඩො. ශ. |
| ඇමෙරිකා එක්සත් ජනපදය | ... 82 25 | ... 54 50 | ... 54 50 |

තැපැල් මල්ලක් සඳහා ලැබියයුතු පාරිතෝෂික, ලියුම් තැපැල සඳහා ඒකකයට ලැබෙන ප්‍රමාණයෙන් 1/16 ක්ද, පාර්සල් තැපැල් සඳහා ඒකකයකට ලැබෙන ප්‍රමාණයෙන් 1/7 ක්ද හිස් මලු අඩංගු තැපැල් මලු සඳහා ඒකකයට ලැබෙන ප්‍රමාණයෙන් 1/16 ක්ද, වේ.

(ආ) මාල දිවයින, බගලාවලින්—

| | |
|---|---|
| ලියුම් හා තැපැල් පත් | ... රාත්තලකට ශත 50 බැගින් |
| පාර්සල් | ... රාත්තලකට ශත 05 බැගින් |
| වෙනත් භාණ්ඩ | ... රාත්තලකට ශත 05 බැගින් |

1—694

---

## සමඟි මණ්ඩල පනත

### 3(2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමඟි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම, මීට යාකොට ඇති උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමඟිදායකයින්ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමඟිදායකයින්ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) උප වගන්තිය යටතේ නිර්දේශයන් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයේ ඇති ආකෘති පත්‍රය මගින් 1970 පෙබරවාරි 28 වන දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970, ජනවාරි මස 10 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

### උපලේඛනය

1. පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි ඕනර පළාත දකුණ ගම් ප්‍රදේශය.
2. පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි ඕනර පළාත උතුර ගම් ප්‍රදේශය.
3. පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි දන්කොටුව සුළු නගර සභා ප්‍රදේශය.
4. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි වේලානෙයි ගම් ප්‍රදේශය.
5. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ පිහිටි කන්තලේ ගම් ප්‍රදේශය.
6. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ පිහිටි මූතූර් සුළු නගර සභා ප්‍රදේශය.
7. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි ගිරිපිටිය ගම් ප්‍රදේශය.
8. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි අවුළුගම ගම් ප්‍රදේශය.

1-696

---

## සමඟි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමඟි මණ්ඩල පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම, ගාලු දිස්ත්‍රික්කය තුළ පිහිටි බලපිටිය සුළු නගර සභා ප්‍රදේශයේ සමඟිදායකයින්ගේ සභාවේ සභාපතිව සිට ඉල්ලා අස්වූ බලපිටිය, වැලිතර පදිංචි රිච්මන්ඩ් ද සොයිසා ගුණවර්ධන මහතා වෙනුවට බලපිටිය, කෙලින් වීදිය, "සිරිනගර්" හි පදිංචි මල්ලියාවඩු ඇන්ඩෘන්කලස් සීසර් ද සිල්වා මහතා එකී සභාවේ සාමාජික ධූරය දරණ කාලය තුළදී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970, ජනවාරි මස 10 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

1-695

## සමගි මණ්ඩල පණත

### ආඥාව

1959 අංක 4 දරන පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ්‍යසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනිපා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූනි 6 වැනි දින අංක 14,857 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 4 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ අතුරුගිරිය ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි—

(1) හෝකන්දර, හෝකන්දර උතුර, "ශාන්ති" හි පදිංචි දොන් ඇඩ්මන් වානගුරු මහතා,
(2) හෝමාගම, දැඩිගමුව, වැලිපිල්ලෑව, ශ්‍රී සුමන මාවතේ පදිංචි කොළඹගේ දොන් ජේම්ස් විල්ප්‍රඩ් සුමණසේකර මහතා,
(3) අතුරුගිරිය, පෝරේ, අංක 311 හි පදිංචි ගාල්ලගේ දොන් මොන්ටි පෙරේරා මහතා,
(4) අතුරුගිරිය, අංක 263/2, "ප්‍රබුද්ධ" හි පදිංචි තලගලගේ ජාන් ජයවර්ධන මහතා,
(5) අතුරුගිරිය, අංක 1 හි පදිංචි රොබට් ජයතිලක මහතා,
(6) අතුරුගිරිය, අංක 519, "සුනේත්‍රා" හි පදිංචි දොන් කරුණාරත්න සේනාධිර මහතා,
(7) අතුරුගිරිය, අංක 7, "චන්ද්‍රිකා" හි පදිංචි දොන් පව්ලිස් සේනානායක මහතා,
(8) පන්නිපිටිය, කලල්ගොඩ පදිංචි පලිහදැරු ආරච්චිගේ මාටින් පෙරේරා මහතා,
(9) හෝකන්දර, හෝකන්දර දකුණ, අංක 102 හි පදිංචි අන්හෙට්ටිගේ ජෝන් පෙරේරා විජේරත්න මහතා,
(10) පන්නිපිටිය, කොට්ටාව උතුර, අංක 1557 හි පදිංචි ගබඩාගේ දොන් විලියම් ගුණරත්න මහතා,
(11) පන්නිපිටිය, කොට්ටාව උතුර, අංක 1600 හි පදිංචි අලුත්ගේ දොන් කරුණාසේකර මහතා,
(12) පන්නිපිටිය, කොට්ටාව දකුණ, පරණ පාර, අංක 454හි පදිංචි දොන් හෙන්ද්‍රික් කන්නන්ගර මහතා,
(13) පන්නිපිටිය, කොට්ටාව දකුණ, පරණ පාර, අංක 383 හි පදිංචි හෙට්ටිගේ තෝමස් අබේසිංහ වීරකෝන් මහතා,
(14) පන්නිපිටිය, කොට්ටාව දකුණ, අංක 527හි පදිංචි දොන් හැරී විල්ප්‍රඩ් රණසිංහ මහතා,
(15) පන්නිපිටිය, රුක්මලේ, "වීරසෙවන" හි පදිංචි වීරක්කොඩිගේ කර්නේලිස් අල්විස් මහතා,
(16) පන්නිපිටිය, රුක්මලේ පදිංචි හෙට්ටිආරච්චිගේ දොන් පත්මසේන මහතා,
(17) පන්නිපිටිය, මාකුඹුර, පිංහේන පදිංචි දොන් සයිමන් රණසිංහ මහතා,
(18) මාලඹේ, හෝකන්දර උතුර, අංක 228හි පදිංචි වේරගලගේ දොන් අර්නෝලිස් මහතා,
(19) හෝකන්දර, හෝකන්දර උතුර, "ශ්‍රියානි" හි පදිංචි හතමුනගේ දොන් චන්ද්‍රසෝම ගුණවර්ධන මහතා,
(20) මුල්ලේගම, හබරකඩ පදිංචි කුඹුහේනගේ දොන් බෙම්පි විජේතුංග මහතා,
(21) හෝමාගම, හබරකඩ පදිංචි සුගතදාස කොතලාවල මහතා,
(22) මුල්ලේගම, "සිංහගිරි" හි පදිංචි දොන් සුභනෝරිස් වෙත්තසිංහ මහතා,
(23) මුල්ලේගම පදිංචි දොන් පව්ලිස් පද්මපෙරුම මහතා,
(24) හෝමාගම, පනාගොඩ, හයිලෙවල් පාර, අංක 4 හි පදිංචි දොන් මාටින් අල්විස් ජයසිංහ මහතා,
(25) මීගොඩ, පනාගොඩ, දික්හැතැම්ම පදිංචි රන්ජිත් ධර්ම ශ්‍රී විතාන මහතා,
(26) හෝමාගම, උතුරුපිටිපන අංක 484 හි පදිංචි වැඩිප්පුලි ආච්චිගේ දොන් වාරිස් සිංඤෝ මහතා,
(27) හෝමාගම, මාවත්ගම, "ගුණ සෙවන" හි පදිංචි දොන් ගුනෝරිස් සුදසිංහ මහතා,
(28) හෝමාගම, උඩුවන පදිංචි හුලද්දුවගේ දොන් සුගතන් මහතා,
(29) පන්නිපිටිය, හිරිපිටිය, අංක 80ඒ හි පදිංචි උඩුවනගේ ජයසේන මහතා,
(30) පන්නිපිටිය, නියදගල, අංක 123 හි පදිංචි මිත්‍රපාල උක්වත්ත මහතා,
(31) පන්නිපිටිය, මාබුල්ගොඩ, "වෙදමැඳුර" හි පදිංචි ගම අච්චිතානලාගේ ආතර් පෙරේරා මහතා,
(32) හෝමාගම, බ්‍රාහ්මණගම, කොස්වැටියන පාරේ පදිංචි දොන් පුණ්‍යසෝම වික්‍රමසිංහ මහතා,
(33) හෝමාගම, පිටිපන දකුණ, දොලහේන පදිංචි දොන් ධර්මසිරි රාජා කලුකපුගේ මහතා,
(34) පන්නිපිටිය, රුක්මලේ පදිංචි අබේසිංහ වීරකෝන් හෙට්ටිගේ ප්‍රැන්සිස් ගෝමස් මහතා.

(ආ) හෝකන්දර, හෝකන්දර උතුර, "ශාන්ති" හි පදිංචි දොන් එඩ්මන්ඩ් වානගුරු මහතා ඉහතකී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1969, ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

1-777

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට, අභාවප්‍රාප්ත වූ ඒ. රසල් මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා රැකීරක්ෂා ඇමතිතුමන් විසින් බී. රාජරාම් මහතා පත්කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. පී. තම්බයියා,
ස්ථිර ලේකම්,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශය.

1970 ජනවාරි මස 9 වැනි දින,
කොළඹ දී ය.

1-766

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර විතාන ආරච්චිගේ සුගතදාස වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද නිශ්චල දේපොළ අත්කර ගැනීම, 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙයින් අනුමත කරමි.

වී. ඒ. සුගතදාස,
ජනසතු සේවා පිළිබඳ ඇමති.

1970.1.8 වෙනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර හේවාගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, තලංගම සුළු නගර සභා සීමාව තුල, උතුරු තලංගම ග්‍රාමසේවක කොට්ඨාශයේ, උතුරු තලංගම නම් ග්‍රාමයේ පිහිටි දළ වශයෙන් අ. 1, රූ. 1, ප. 0 ක් පමණ වන ඉඩම් කැබැලි දෙකක්.

"ඒ" වෙනි කොටස

උතුරට : බත්තරමුල්ල-කඩුවෙල මහා මාර්ගයය ;
නැගෙනහිරට : තලංගල කොස්වත්තේ පදිංචි දොස්තර පී. ඩී. පෙරේරා මහතාට අයිතියැයි කියන ඉඩම ;
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;
බස්නාහිරට : මීගොඩ, තලහේන පදිංචි ඩී. ඩී. ඩී. ජයසූරිය මහතාට අයිතියැයි කියන ඉඩම.
යන මේ මායිම් තුළ පිහිටියේ ය.

"බී" වෙනි කොටස

උතුරට : අතුරුගිරිය-මාලඹේ මහා මාර්ගය හා එම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ;

දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;
බස්නාහිරට : මාලාබේ, උතුරු තලංගම, උඩවත්ත පදිංචි සිරිල් සේනානායක සහ ඉන්ද්‍රසේන සේනානායක යන අයට අයිතියැයි කියන ඉඩමය.
යන මේ මායිම් තුළ පිහිටියේ ය.

2. අත්කර ගැනීමට තිබෙන ඉඩම් කොටස් පිළිබඳ විස්තර මෙසේ ය :—

“ ඒ ” වෙනි කොටස

ඉඩමේ නම : දෙඹගහවත්ත ;
විස්තරය : රබර් සහ පොල් වගාවෙන් යුතු ඉඩම ;
වගී ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 20 ක් පමණය ;
අයිතිය ප්‍රකාශ කරන්නන්ගේ නම් සහ ලිපිනයන් : සිරිල් සේනානායක සහ ඉන්ද්‍රසේන සේනානායක, උඩවත්ත, උතුරු තලංගම, මාලාබේ.

“ බී ” වෙනි කොටස

ඉඩමේ නම : දෙඹගහවත්ත ;
විස්තරය : රබර් වගාවෙන් යුතු ඉඩම ;
වගී ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 20 ක් පමණය ;
අයිතිය ප්‍රකාශ කරන්නාගේ නම සහ ලිපිනය : පී. සී. පෙරේරා, කොස්වත්ත, තලංගම.

1-605

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර විතාන ආරච්චිගේ සුගතදාස වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද නිශ්චල දේපොළ අත්කර ගැනීම, 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙයින් අනුමත කරමි.

වී. ඒ. සුගතදාස,
ජනසතු සේවා පිළිබඳ ඇමති.

1970.1.6 වෙනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර හේවාගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, පාදුක්ක වග කම්කායම් සහා සීමා තුළ, පාදුක්ක ග්‍රාමසේවක කොට්ඨාශයේ, පාදුක්ක නම් ග්‍රාමයේ පිහිටි දළ වශයෙන් අක්කර 2 ක් පමණ ඉඩම් කැබැල්ලක්.

උතුරට : කොළඹ-ඉංගිරිය මහා මාර්ගයය ;
නැගෙනහිරට : මොරගහතැන්න විද්‍යාචන්ද්‍ර පිරිවෙන් භූමියය ;
දකුණට : පාදුක්ක ගම්කායම් සහා නිවාස යෝජනා ක්‍රමය ;
බස්නාහිරට : “ සේනානායක පෙදෙස ” ය ;
යන මේ මායිම් තුළ පිහිටියේ ය.

2. අත්කර ගැනීමට තිබෙන ඉඩම් කොටස පිළිබඳ විස්තර මෙසේ ය :—

ඉඩමේ නම : මොරගහතැන්න ;
විස්තරය : පැලපොල් වගාවක් සහිතය ;
වගී ප්‍රමාණය : අක්කර දෙකක් (2ක්) පමණය ;
අයිතිය ප්‍රකාශ කරන්නන්ගේ නම් සහ ලිපිනයන් : 1. කිව්. ඩී. පද්මපෙරුම, ගලගෙදර, පාදුක්ක, 2. පී. ඩී. පද්මපෙරුම, ගලගෙදර, පාදුක්ක.

1-604

---

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණත

### 25 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර විතාන ආරච්චිගේ සුගතදාස වන මම, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනාගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනා කර ඇත්තාවූද නිශ්චල දේපොළ අත්කර ගැනීම, 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙයින් අනුමත කරමි.

වී. ඒ. සුගතදාස,
ජනසතු සේවා පිළිබඳ ඇමති.

1970.1.6 වෙනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර හේවාගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, අතුරුගිරිය සුළු නගර සභා සීමා තුල, කොට්ටාව ග්‍රාමසේවක කොට්ඨාශයේ, කොට්ටාව නම් ග්‍රාමයේ පිහිටි දළ වශයෙන් අ. 0, රූ. 2, ප. 36 ක් පමණ වන ඉඩම් කැබැල්ලක්.

“ ඒ ” වෙනි කොටස

උතුරට : 1. හොරණ පාර්ලිමේන්තු මන්ත්‍රී රත්නසිරි වික්‍රමනායක මහතාට අයිතියැයි කියන ඉඩම, 2. විල්ලව, කිදෙල්පිටිය පදිංචි ඩී. ඊ. අමරසිංහ මහතාට අයිතියැයි කියන ඉඩම ;
නැගෙනහිරට : 1. විල්ලව, කිදෙල්පිටිය පදිංචි ඩී. ඊ. අමරසිංහ මහතාට අයිතියැයි කියන ඉඩම, 2. පන්නිපිටිය, හයිලෙවල් පාරේ අංක 128 දරණ ස්ථානයේ පදිංචි ඩී. කේ. වික්‍රමසිංහ මහතාට අයිතියැයි කියන ඉඩම ;
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;
බස්නාහිරට : 1. කොට්ටාව, අතුරුගිරිය පාරේ අංක 622 දරණ ස්ථානයේ පදිංචි ඩී. ඊ. එස්. අමරසේකර මහත්මියට අයිතියැයි කියන ඉඩම, 2. හොරණ පාර්ලිමේන්තු මන්ත්‍රී රත්නසිරි වික්‍රමනායක මහතාට අයිතියැයි කියන ඉඩම.
යන මේ මායිම් තුළ පිහිටියේ ය.

“ බී ” වෙනි කොටස

උතුරට : හොරණ පාර්ලිමේන්තු මන්ත්‍රී රත්නසිරි වික්‍රමනායක මහතාට අයිතියැයි කියන ඉඩම ;
නැගෙනහිරට : විල්ලව, කිදෙල්පිටිය පදිංචි ඩී. ඊ. අමරසිංහ මහතාට අයිතියැයි කියන ඉඩම ;
දකුණට : කොළඹ හෝමාගම මහා මාර්ගයය ;
බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසය.
යන මේ මායිම් තුළ පිහිටියේ ය.

“ සී ” වෙනි කොටස

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටසය ;
නැගෙනහිරට : විල්ලව, කිදෙල්පිටිය, පදිංචි ඩී. ඊ. අමරසිංහ මහතාට අයිතියැයි කියන ඉඩම ;
දකුණට : කොට්ටාව, අතුරුගිරිය පාරේ අංක 622 දරණ ස්ථානයේ පදිංචි ඩී. ඊ. එස්. අමරසිංහ මහත්මියට අයිතියැයි කියන ඉඩම ;
බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසයය.
යන මේ මායිම් තුළ පිහිටියේ ය.

2. අත්කර ගැනීමට තිබෙන ඉඩම් කොටස් පිළිබඳ විස්තර මෙසේ ය :—

“ ඒ ” වෙනි කොටස

ඉඩමේ නම : ගොඩපරගහවත්ත ;
විස්තරය : පොල් ඉඩමකි ;
වගී ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 0 ;
අයිතිය ප්‍රකාශ කරන්නාගේ නම සහ ලිපිනය : ඩී. ඊ. අමරසේකර, කිදෙල්පිටිය, විල්ලව.

“ බී ” වෙනි කොටස

ඉඩමේ නම : ගොඩපරගහවත්ත ;
විස්තරය : පොල් ඉඩමකි ;
වගී ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 26 ;
අයිතිය ප්‍රකාශ කරන්නාගේ නම සහ ලිපිනය : ඩී. ඊ. එස්. අමරසේකර මහත්මිය, අංක 622, අතුරුගිරිය පාර, කොට්ටාව.

“ සී ” වෙනි කොටස

ඉඩමේ නම : ගොඩපරගහවත්ත ;
විස්තරය : පොල් ඉඩමකි ;
වගී ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10 ;
අයිතිය ප්‍රකාශ කරන්නාගේ නම සහ ලිපිනය : රත්නසිරි වික්‍රමනායක, පාර්ලිමේන්තු මන්ත්‍රී, හොරණ.

1-606

---

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය නැවත සකස් කිරීම

1970 පෙබරවාරි මස 1 වැනිදා සිට කොඩ්ඩියාර් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය ප්‍රාදේශීය නිලධාරි කොට්ඨාශ දෙකකට බෙදා (I) මූතූර් හා (II) සේරුවිල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය යනුවෙන් ඇති කළ බව මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. මුතූර් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විත වේ :—

| කොට්ඨාශ අංක | | | නම |
|---|---|---|---|
| 216 | ... | ... | තොප්පූර් |
| 218 | ... | ... | මල්ලිකාතිව් |
| 219 | ... | ... | පල්ලිකුඩුරිප්පු |
| 220 | ... | ... | සම්පූර් |
| 221 | ... | ... | කූනිතිව් |
| 222 | ... | ... | කච්චෙයිපරිච්චාන් |
| 223 | ... | ... | මූතූර් (දෙමළ) |
| 224 | ... | ... | මූතූර් (මුස්ලිම්) |

සේරුවිල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විත වේ :—

| කොට්ඨාශ අංක | | | නම |
|---|---|---|---|
| 214 | ... | ... | ඊච්චලම්පත්තයි |
| 215 | ... | ... | සේරුවිල |
| 217 | ... | ... | දෙහිවත්ත |

3. පහත සඳහන් ගම්කාර්‍ය සභා ප්‍රදේශ ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවලට අඩංගු වෙනවා ඇත :—

**(අ) මුතූර් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය**

(1) තොප්පූර් ග. කා. සභාව.
(2) මල්ලිකාතිව් ග. කා. සභාව.
(3) සම්පූර් ග. කා. සභාව.
(4) කච්චෙයිපරිච්චාන් ග. කා. සභාව.
(5) මූතූර් සුළු නගර සභාව.

**(ආ) සේරුවිල ප්‍රා. ආ. නි. කොට්ඨාශය**

(1) ඊච්චලාම්පත්තයි ග. කා. සභාව.
(2) සේරුවිල ග. කා. සභාව.
(3) දෙහිවත්ත ග. කා. සභාව.

4. පහත සඳහන් ගම්බද උසාවි ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවලට අධිකරණය බලපවත්වනවා ඇත :—

**(අ) මූතූර් ප්‍රා. ආ. නි. කොට්ඨාශය**

(1) මුතූර් ගම්බද උසාවිය.
(2) තොප්පූර් ගම්බද උසාවිය.

**(ආ) සේරුවිල ප්‍රා. ආ. නි. කොට්ඨාශය**

(1) ඊච්චලාම්පත්තයි ගම්බද උසාවිය.
(2) තොප්පූර් ගම්බද උසාවිය.

5. නව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශ පහත සිඳහන් පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාශවලට අයත් වනවා ඇත :—

**(අ) මූතූර් ප්‍රා. ආ. නි. කොට්ඨාශය**

(1) මුතූර් මන්ත්‍රී කොට්ඨාශය

**(ආ) සේරුවිල ප්‍රා. ආ. නි. කොට්ඨාශය**

(1) මුතූර් මන්ත්‍රී කොට්ඨාශය

6. මෙම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවල කාර්යාල පහත සඳහන් ස්ථානයන්හි පිහිටා ඇත :—

(අ) මුතූර් ප්‍රා. ආ. නි. කොට්ඨාශය—මුතූර්
(ආ) සේරුවිල ප්‍රා. ආ. නි. කොට්ඨාශය—අලුඔලුව.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ 7,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේදීය.

1—763

---

අංකය : ඩබ්. 105/817.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා වතු සේවා සංගමය, 13, කන්දේ වීදිය, මහනුවර හා ඉයුජින් හර්මන් මහත්මිය අයිතිකාරිය, මහතැන්න වත්ත, ඇල්කඩුව, පී. එච්. රොබට්ස් මහත්මිය බාරේ, අංක 15, ගෝතමී පටුමග, ටෙම්ප්ලර්ස් පාරෙන් ඔබ්බේ ගල්කිස්ස අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද, කම්කරු හා රැකිරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහමඩ් හනීපා මොහමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනතවලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දෙහිවල, ඇලන් ඇවනිව්, අංක 72 හි අර්ල් ද අල්විස් මහතා මෙයින් පත්කරනු ලැබේ.

එම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 ජනවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය, කාර්මික ආරාවුල් පනත

ලංකා වතු සේවා සංගමය, 13, කන්දේ වීදිය, මහනුවර.

සහ

ඉයුජින් හර්මන් මහත්මිය,

අයිතිකාරිය : මහතැන්න වත්ත, ඇල්කඩුව, පී. එච්. රොබට්ස් මහත්මිය බාරේ, අංක 15,. ගෝතමී පටුමග, ටෙම්ප්ලර්ස් පාරෙන් ඔබ්බේ, ගල්කිස්ස.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ ලංකා වතු සේවා සංගමයේ සාමාජිකයින් වන ඇල්. ජේ. සිල්වා (සහකාර ලිපිකරු) සහ එස්. සතිවේල් (සහකාර කම්හල් නිලධාරි) යන මහතුන්ගේ සේවය ඇල්කඩුවේ, මහතැන්න වත්තේ පාලක පක්ෂය විසින් අහෝසි කිරීම යුක්ති සහගතද, යන්න හා ඔවුන් එකිනෙකාට කවර සහනයක් හිමිවිය යුතුද යන්න වේ.

1969 දෙසැම්බර් මස 31 වැනි දා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

1—600

---

## නිවැරදි කිරීම

### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥා පණතේ 10(3) වැනි වගන්තිය යටතේ, 1965 දෙසැම්බර් මස 31 වෙනි දින අංක 14,604 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද අංක 77—උඩුවිල් මැතිවරණ කොට්ඨාශය සම්බන්ධයෙන් වූ උපලේඛනය පහත සඳහන් අයුරින් සංශෝධනය වී කියවිය යුතුය :—

(ඒ) "ඒ" අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශයේ විස්තර පහත දක්වෙන අයුරින් කියවිය යුතුය :—
වලිගාමම් බටහිර කොට්ඨාශයේ, ආනයිකෝඩ්ඩෙයි ග්‍රාම සේවක කොට්ඨාශයට අයත්, ආනයිකෝඩ්ඩෙයි ග්‍රාමයේ කොටසකින් සමන්විත මානිප්පායි ගම් සභා ප්‍රදේශයේ අංක 5 සහ 6 දරණ කොට්ඨාශ සහ ආනයිකෝඩ්ඩෙයි ග්‍රාමයේ කොටසකින් සමන්විත යාපනය මහ නගර සභා ප්‍රදේශයේ අංක 20 දරණ කොට්ඨාශයේ සුළු කොටසක්

(බී) "ඒඒ" අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශ විස්තරයේ දක්වෙන "ඉනුවිල් ග්‍රාම සේවක කොට්ඨාශයේ" වෙනුවට "තාවඩි ග්‍රාම සේවක කොට්ඨාශයේ" යනුවෙන් ඇතුලත් කළ යුතුය.

(සී) "බීබී" අක්ෂර දරණ ඡන්ද කොට්ඨාශ විස්තරයේ දක්වෙන "ඉනුවිල් ග්‍රාම සේවක කොට්ඨාශයේ" වෙනුවට "තාවඩි ග්‍රාම සේවක කොට්ඨාශයේ" යනුවෙන් ඇතුලත් කල යුතුය.

ඇස්. කන්දසාමි,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරිතැන,
මැතිවරණ කොට්ඨාශ අංක 77—උඩුවිල්.

මැතිවරණ කාර්යාලය,
කච්චේරිය, යාපනය,
1969.12.18 වෙනි දින.

1—698

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

### ගමනා ගමනයට අවහිර

දකුණු කොට්ඨාශය ගාල්ල දිස්ත්‍රික්කය

**ගාල්ල-උඩුගම පාරේ අංක 7/6 දරණ පාලම නැවත තැනීම**

ඉහත සඳහන් මාර්ගයේ අංක 7/6 දරණ පාලම නැවත දන්වන තුරු ගමනාගමනයට වසා දමා ඇත.

ඒ සඳහා විකල්ප මාර්ගය ලබුදූව-අක්මීමන-කුරුදුවත්ත මාර්ගය වේ.

මහා මාර්ග අධ්‍යක්ෂ.

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1.
1970 ජනවාරි මස 11 වැනි දින,

1—844

---

## ගාල්ල දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශය නැවත සකස් කිරීම

1970 පෙබරවාරි මස 1 දින සිට ගාල්ල දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය 'ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ දෙකකට බෙදා ගඟබඩ පත්තුව දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය සහ ගඟබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය යනුවෙන් ඇතිකළ බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

2. (අ) ගඟබඩ පත්තුව දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ග්‍රාමසේවක කොට්ඨාශ වලින් සමන්විත වනවා ඇත :—

| කොට්ඨාශ අංකය | | නම |
|---|---|---|
| 94 බී | ... | සොල්ගහවිල |
| 184 | ... | බද්දේගම උතුර |
| 186 | ... | බද්දේගම නැගෙනහිර |
| 187 | ... | බොරලුකඩ |
| 188 | ... | හැම්මැලිය |
| 189 | ... | මාබොටුවන |
| 190 | ... | ඉහල ලේල්වල |
| 191 | ... | පහල ලේල්වල |
| 192 | ... | අම්පේගම |
| 193 | ... | දිවිතුර |
| 196 | ... | පාත වැලිවිටිය |
| 197 | ... | අගලිය |
| 198 | ... | ගනේගම උතුර |
| 199 | ... | හල්පාතොට |
| 200 | ... | මැද කීඹිය |
| 201 | ... | කෙරදේවල |
| 202 | ... | මාජුවාන |
| 203 | ... | ගිනිමැල්ලගහ නැගෙනහිර |
| 204 | ... | තෙලිකඩ |
| 205 | ... | හොරගම්පිට |
| 206 | ... | වල්පිට උතුර |
| 206 ඒ | ... | වල්පිට දකුණ |
| 207 | ... | ඉහල කීඹිය |
| 208 | ... | පහල කීඹිය |
| 220 | ... | ගනේගම දකුණ |
| 221 | ... | වදුරඹ |
| 223 | ... | ඇත්කඳුර. |

(ආ) ගඟබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශ වලින් සමන්විත වනවා ඇත :—

| කොට්ඨාශ අංකය | | නම |
|---|---|---|
| 194 | ... | උඩවැලිවිටිය |
| 209 | ... | යටලමත්ත |
| 210 | ... | උඩලමත්ත |
| 210 ඒ | ... | ගෝනදෙනිය |
| 211 | ... | උනන්විටිය |
| 212 | ... | කැප්පිටියාගොඩ |
| 213 | ... | පරණ නානායම්ගොඩ |
| 214 | ... | අලුත් නානායම්ගොඩ ඉහල |
| 215 | ... | අලුත් නානායම්ගොඩ පහල |
| 216 | ... | නාගොඩ |
| 217 | ... | ගෝනලගොඩ |
| 218 | ... | උඩුගම බටහිර |
| 219 | ... | උඩුගම නැගෙනහිර |
| 222 | ... | ඌරල |

3. පහත සඳහන් ගම්කාර්ය සභා ප්‍රදේශ ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවලට අඩංගුවනවා ඇත :—

(අ) ගඟබඩ පත්තුව දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—

බද්දේගම ගම්කාර්ය සභාව.
වදුරඹ ගම්කාර්ය සභාව.
වැලිවිටිය-දිවිතුර ගම්කාර්ය සභාව.
තෙලිකඩ-මාජුවාන ගම්කාර්ය සභාව.

(ආ) ගඟබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :

නාගොඩ ගම්කාර්ය සභාව.
යටලමත්ත ගම්කාර්ය සභාව.
උඩුගම ගම්කාර්ය සභාව.

4. පහත සඳහන් ගම්බද උසාවි ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවල අධිකරන බල පවත්වනවා ඇත :—

(අ) ගඟබඩ පත්තුව දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :

බද්දේගම ගම්බද උසාවිය.
නාගොඩ ගම්බද උසාවිය.

(ආ) ගඟබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :

නාගොඩ ගම්බද උසාවිය.

5. පහත සඳහන් පාර්ලිමේන්තු ඡන්ද කොට්ඨාශ ප්‍රදේශ ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවලට අයත්වනවා ඇත :—

(අ) ගඟබඩ පත්තුව දකුණු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :

අංක 57 බෙන්තර-ඇල්පිටිය ඡන්ද කොට්ඨාශය (කොටසක්)

අංක 59 බද්දේගම ඡන්ද කොට්ඨාශය (කොටසක්)

(ආ) ගඟබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :

අංක 58 හිනිදුම ඡන්ද කොට්ඨාශය (කොටසක්)

6. මෙම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශවල කාර්යාල පහත සඳහන් ස්ථානයන්හි පිහිටා ඇත :—

(අ) ගඟබඩ පත්තුව දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :

බද්දේගම

(ආ) ගඟබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය :

නාගොඩ.

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ජනවාරි මස 12 දින,
කොළඹ ස්වදේශ කටයුතු පිළිබඳ
ඇමති කාර්යාලයේදී ය.

1—850

---

## බලපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම

### වට්ටුවාකල් ධීවර අණපනත්—1970-71

1957 අප්‍රේල් මස 5 වැනි දා අංක 11,103 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අණපනත්වල 2 වැනි හා II වැනි ව්‍යවස්ථා කෙරෙහි සැලකිල්ල යොමු කරවනු ලැබේ.

එහි 3 වැනි ව්‍යවස්ථාව යටතේ සුදුසුකම් ලබා ඇති සැම දෙනා ම විසින් තමන්ගේ ඉල්ලුම් පත්‍ර 1970 පෙබරවාරි 20 වැනිදාට පෙර, කොළඹ 3, ධීවර පර්යේෂණායතනයේ ධීවර අධිකාරිවෙත එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර මුලතිව් ධීවර කාර්යාලයෙන්, මුලතිව් කල්ලපාඩු සහ වට්ටුවාකල් ග්‍රාම සේවකයින්ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල එවිය යුතුය. 1970 පෙබරවාරි 20 ට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 9 වැනිදා,
කොළඹ 3 දී ය.

1—796

## නිවේදනයයි

**1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (534 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත**

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥා පනතේ 33 වන වගන්තිය යටතේ මහනුවර ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, වැඩ බලන ගොවිජන සේවා කොමසාරිස් එරික් ජැක්සන් ද සිල්වා වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

ඊ. ජේ. ද සිල්වා,
වැඩ බලන ගොවිජන සේවා කොමසාරිස්.

දිනය : 69. 7. 14.

### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නම සහ විස්තරය : බතී, හාලඇල අමුණ ව්‍යාපාරය, ජේ/21 (13.30×6.85).

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළ හැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :—

පෞද්ගලික ඉඩම් : දළ වශයෙන් අක්කර 70 යි.
රජයේ ඉඩම් : දළ වශයෙන් අක්කර—යි.

3. එකඟවූ කොන්දේසි නම් :—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම් :—

(අ) අමුණ ඉදි කිරීම ;
(ආ) ඇල ප්‍රතිසංස්කරණය කිරීම ;
(ඇ) ආරක්ෂක බැමි ඉදි කිරීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 11,500 දක්වා තැනීම රජය විසින් භාරගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථොක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත තම කොටස ඉටු කිරීම යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම් වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥාපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

1—601

## රථවාහන ගමනාගමනයට බාධා

**දකුණු පළාත** **මාතර දිස්ත්‍රික්කය**

### තිබ්බොටුවාව-දන්කොලුව පාරේ අංක. 3/4 දරණ පාලම

ඉහත සඳහන් පාලම, නැවත දන්වන තුරු වසා තබන බව මහ ජනයාට මෙයින් දැනුම් දෙනු ලැබේ.

රථවාහන ගමනා ගමනය සඳහා විකල්ප ගමන් මාර්ගය පහත සඳහන් පරිදිය :—

ගාල්ල-දෙනියාය-පැල්මඩුල්ල පාර.

ඇස්. සෙල්වදෙරේ,
අධ්‍යක්ෂ මහා මාර්ග වෙනුවට.

ප්‍රධාන කාර්යාලය,
මහා මාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1970.1.10.

1—769

---

## දැන්වීමයි

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගව්යින් අතර රක්තාශ්‍රව නැමැති රෝගය පැතිරී යන බැවි 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශෝධිත) පනත සහ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ ආඥාපනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය (470 වැනි පරිච්ඡේදය) යටතේ මා විසින් වර්ෂ 1969.12.12 දින අංක 14,884 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1970.1.13 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ස. පා. හා. සෞ.)
කාර්යාලයේදීය,
තැ. පෙ. 1284, කොළඹ.

1—842

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1970**

| මාසය | | පළ කිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 70. 1. 2 | සිකුරාද | ... | 69.12.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1. 9 | සිකුරාද | ... | 70. 1. 2 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1.16 | සිකුරාද | ... | 70. 1. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 1.23 | සිකුරාද | ... | 70. 1.16 | සිකුරාද | දවල් | 12.00 |
| | | 70. 1.29 | බ්‍රහස්පතින්ද | ... | 70. 1.21 | බදාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | ... | 70. 1.28 | බදාද | ප.ව. | 3.30 |
| | | 70. 2.13 | සිකුරාද | ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 70. 2.20 | සිකුරාද | ... | 70. 2.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 2.27 | සිකුරාද | ... | 70. 2.20 | සිකුරාද | දවල් | 12.00 |
| මාර්තු | ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 | සිකුරාද | දවල් | 12.00 |
| | | 70. 3.13 | සිකුරාද | ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 | සිකුරාද | ... | 70. 3.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 | බ්‍රහස්පතින්ද | ... | 70. 3.20 | සිකුරාද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1969 දෙසැම්බර් 12 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.**

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි